**බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2016**

-----------------------------------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බීඕසී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය සිදුකරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 154(6) ව්‍යවස්ථාව යටතේ මෙම වාර්තාව නිකුත් කරන ලදී.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ( "අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

-------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**2 මූල්‍ය ප්‍රකාශන**

-------------

**2.1 මතය**

------

සමාගමේ මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියමිත අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව, පහත දෑ සම්බන්ධයෙන් කරුණු ගෙනහැර දක්වමි.

(අ) විගණන මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණන සීමාකිරීම් ඉහත සඳහන් පරිදි වේ.

(ආ) මා දරන්නා වූ මතය නම්,

- මා විසින් විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් ලබාගන්නා ලද බව සහ මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සමාගම විසින් නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව.
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුකූල බව.

## 2.2 මූල්‍ය ප්‍රකාශන මත අදහස් දැක්වීම්.

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ලබාදී ඇති තොරතුරු අනුව 2016 දෙසැම්බර් 31 දිනට බදු වගකීම රු. 162,756 ක් වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බදු වගකීම රු. 282,555 ක් ලෙස දක්වා තිබුණි. එහෙයින් මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු බදු වගකීම රු. 119,799 ක් වැඩිපුර දක්වා තිබුණි.

### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොමැති වීම

මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු ශේෂයන්, ලැබිය යුතු දිරිදීමනා හා ගෙවිය යුතු අනෙකුත් දෑ එකතුව රු. 423,542 කට ඍජු තහවුරු කිරීම් නොමැති වීම හේතුවෙන් විගණනයේ දී සත්‍යාපනය කළ නොහැකි විය.

## 3 මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය වූ රු. 581,271 සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ දී සමාගම බදු පෙර ශුද්ධ ලාභය රු.487,615 ක් උපයාගෙන තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 93,656 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂය තුලදි භාණ්ඩාගාර බිල්පත්වල හා ස්ථාවර තැන්පතුවල අළුතින් සිදු කරන ලද ආයෝජන නිසා පොලී ආදායම් ඉහළ යාම මූල්‍ය ප්‍රතිඵලය වර්ධනය සඳහා ප්‍රධාන දායකත්වය විය.

සමාලෝචිත වර්ෂය තුළ වැයකල මුළු වියදමින් විගණන ගාස්තු සඳහා රු. 20,414 ක් හෙවත් සියයට 23 ක් වැයකර තිබුණු අතර ලියාපදිංචි අයබදු ගාස්තු සඳහා රු. 60,000 ක් හෙවත් 67 ක් වැයකර තිබුණි.

## 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 ලාභදායීත්වය

සමාගම ප්‍රධාන ව්‍යාපාර ක්‍රියාකාරකම් හි නිරතවීමකින් තොරව භාණ්ඩාගාර බිල්පත් සහ ස්ථාවර තැන්පතුවල අමතර අරමුදල් ආයෝජනයෙන් මුළු මෙහෙයුම් ආදායම උපයාගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා හා පසුගිය වර්ෂ 04 ක් සඳහා මෙහෙයුම් ආදායම් සහ බදු පසු ශුද්ධ ලාභය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වර්ෂය | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 670,831 | 512,825 | 508,886 | 678,674 | 527,517 |
| බදු පසු ශුද්ධ ලාභය | 418,515 | 351,083 | 341,801 | 471,437 | 440,235 |

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන හා අනෙකුත් තොරතුරුවලට අනුව සමාලෝචිත වර්ෂයේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පසුගිය වර්ෂ 04 ක් සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත (සියයට)** | | | | | |
| මුළු වත්කම් මත ප්‍රතිලාභය | 6 | 5 | 5 | 7 | 6 |
| **ද්‍රවශීලතා අනුපාත (වාර ගණන)** | | | | | |
| ජංගම අනුපාතය | 25.6 | 23.4 | 23.1 | 12.7 | 21.4 |
| මුළු වත්කම් වලට ශුද්ධ ජංගම වත්කම් | 0.96 | 0.96 | 0.96 | 0.92 | 0.95 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂ පහක කාලපරිච්ඡේදය තුල සමාගම උපයාගෙන තිබූ ලාභය ව්‍යාපාරය තුල යෙදවූ ප්‍රාග්ධනය සමඟ සැසඳීමේදී සතුටුදායක මට්ටමක නොවීය.

(ආ) සමාගම විසින් රු. මිලියන 9.3 හෙවත් අරමුදලින් සියයට 98 ක් භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතු වැනි කෙටිකාලීන ආයෝජනයන් තුල ආයෝජනය කර තිබුණි. එබැවින් සමාගමෙහි ඉහළ ද්‍රවශීලතා තත්ත්වයක් පවතින අතර ඉතා දුර්වල කාරක ප්‍රාග්ධන කළමණාකරනයක් සමාගමෙහි පෙන්නුම් කෙරේ.

(ඇ) සමාගමේ රු. මිලියන 9.9 ක් වටිනා මුළු වත්කම් සමඟ සැසඳීමේ දී ශුද්ධ ජංගම වත්කම් සියයට 96 ක් විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

### 4.1 කාර්යයසාධනය

--------------------

ලංකා බැංකුවේ සේවක අවශ්‍යතා සැපයීම පිණිස සේවකයින් බඳවා ගැනීම සමාගමේ මූලික ව්‍යාපාර ක්‍රියාකාරකම වුවත් 2007 වර්ෂයේ සිට සමාගම මෙම මූලික ක්‍රියාකාරකම්හි යෙදී නොතිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේ සිට සමාගම මූලික ක්‍රියාකාරකම් නවතා දැමුවත් සමාගම ඈවර කිරීමට ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ 2008 ජූලි 07 දින නැවත ලියාපදිංචි කර තිබුණි. කෙසේ වුවද, 2017 ජූලි 31 දින පැවති ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සමාගම ඈවර කිරීමේ තීරණය අනුමත කර තිබුණි.

(ආ) පරිපාලනමය අරමුණු සඳහා ලංකා බැංකුව විසින් පත්කළ ප්‍රධාන විධායක නිලධාරියා හා අධ්‍යක්ෂකවරුන්ට අමතරව සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගමේ සේවකයන් සේවා නියුක්ත නොවීය.

(ඇ) 2016 වර්ෂයේ රජයේ අයවැය යෝජනාවන්ට අනුව පෞද්ගලික සමාගමක් වාර්ෂික ලියාපදිංචි ගාස්තු ලෙස රු. 60,000 ක් ගෙවීමට වගකීමෙන් බැඳේ. ඒ අනුව සමාගම 2016 ජුනි මාසය තුල රු. 60,000 ක් ගෙවා තිබුණ අතර එය සමාගමේ මුළු ආදායමෙන් සියයට 9 ක් විය. 2007 වර්ෂයේ සිට සමාගම අපේක්ෂිත ක්‍රියාකාරකම්වල යෙදීමෙන් තොරව දිගටම පවත්වාගෙන යාම ප්‍රශ්ණ සහගත වේ.